# අපි අතිනුත් වැරදි සිද්ධ වෙනවා.

-රිතූ ආකර්ශා



පසුගිය දවස්වල අන්තර්ජාලය පුරාම රිතුගේ රිය අනතුර ගැන විවිධ අයුරින් කතාබහ කරලා තිබ්බා. එහි ඇත්ත නැත්ත දැනගන්නයි අපි ඇයට කතා කළේ.

**ඇත්තටම එදා මොකද වුනේ රිතූ?**

එදා දවසම ෂූටිං තිබුනා. මමයි, තව නංගි කෙනෙකුයි මගේ වාහනේ ආවා. Drive කළේ මම, ඒ නංගිව රාජගිරියේ එයාලගෙ ගෙදරින් දාලා මම ආවා. මහන්සියටද මන්දාමට නිදිමතක් ආවා, ඇහැපියවෙනවත් එක්කම පාර්ලිමේන්තුවේ බැරියර් එකක හැප්පුනා.

**ඔයාට තුවාල වුනාද?**

නැහැ, මට කිසි තුවාලයක් නැහැ. ඒත් වාහනේට නම් ගොඩක් ඩැමේජ් වුනා.

**මේ ගැන මුලින්ම කියන්න කතා කළේ කාටද?**

මගේ තාත්තාට, මගේ තාත්තා වැඩකරන්නේ පොලිසියෙ. පස්සෙ පොලිසියට කතා කළා. එයාලා මගේ ලයිසන් එක ගත්තා. මට තලංගම පොලිසියට එන්න කිව්වා, අපි ගිහින් කට උත්තරයක් දුන්නා.

**ඒත් මේ සිදුවීම යට ගහන්න ඇමති කෙනෙක් සම්බන්ධයි කියනවා?**

ඒ වගේ දෙයක් කියන්න මිනිස්සු හිත හදාගන්නෙ කොහොමද කියලා මට හිතාගන්න බැහැ, අනික බොරු දෙයක්. ඒ මේ සිද්ධිය යට ගහන්න මං. අතින් මිනිස් ජීවිතයකට හානිවුනේ නැහැ, අඩුම තරමේ ලේ හෙලවීමක්වත් වුනේ නැහැ.ඉතින් ඇයි මේක යට ගහන්නේ. අනික මට කිසිම ඇමති කෙනෙක්වත්, මන්ත්‍රී කෙනෙක්වත් විශේෂ නැහැ.



**ඒත් ඔයා අනතුර වුන තැනදි ඇමතිවරයෙක්ට කෝල් කළා කියනවා නේද?**

තාත්තා පොලිසියේ ඉද්දිදි ඇයි මං ඇමතිවරුන්ට, මන්ත්‍රීවරුන්ට කියන්නේ? අනික මං හිතාමතා වරදක් කළේ නැහැ. ඉතින් ඇයි මං බයවෙන්නේ.

**ඒ කියන්නේ දේශපාලන කතා බොරු?**

ඔව්, කිසිම ඇමති කෙනෙක් එක්කවත් මන්ත්‍රී කෙනෙක් එක්කවත් මගේ කිසිම සම්බන්ධයක් නැහැ.

බුද්ධිනී ජයවර්ධන

# මිල්ටන්ලා

## සැබෑ ආදරය වෙනුවෙන් ගැයූ ගී

ජේ.ඒ.මිල්ටන් පෙරේරා මෙන්ම මිල්ටන් මල්ලවආරච්චිද අපේ ගීත ලෝකයේ ජනකාන්ත ආදරණීය ගායන ශිල්පීන් දෙපළක් වූ බව අමුතුවෙන් කිව යුතු නැත. ඔවුන් දෙදෙනාම ගැයූ ගී අතරින් බහුතරය ආදර ගීතය.

එම ගීත අතර ඇතැම් ගී ඔවුන්ගේ හා සෙසු අයගේ සැබෑ ආදර සබඳතා මුල් කොටගෙන ගැයූ ඒවාය.

*බැලුවේ නෑනේ මාගෙ දිහා*
*ඔබ නිසා ප්‍රියේ දුක් වින්දෙමි මා. . . .*

යනුවෙන් මිල්ටන් පෙරේරා ගැයූ ගීතයේ 'එහෙම නෙමෙයි මාලා මාගේ - කොමලයි වන දෙව්ලිය වාගේ ' ලෙසින් සඳහන් වන්නේ එකල මිල්ටන්ගේ පෙම්වතියක වූ 'මාලා' ගැනය. පසුව මිල්ටන් මාලා එක් වූ අතර ප්‍රියංකර පෙරේරා ඔවුන්ගේ පුතාය. 'අහන්න ආදරෙයි මාලා' ගීතයද මිල්ටන් පෙරේරා ගැයුවේ මාලා වෙනුවෙනි.

*සිහින දෙව්දුවේ*
*ඔබට තුන්ලොවේ*
*එකම නමයි මා දන්නේ*
*ඒ නම ආදරේ. . . .*

මිල්ටන් පෙරේරා ගැයූ එම ගීතයේ 'කල්‍යාණි නමට අම පෙම් - දිවි බඳුන පුද කරන්නම් ' යන සඳහන මිල්ටන්ගේ එවක පෙම්වතිය වූ කල්‍යාණි ගැනය. පසුව මිල්ටන් - කල්‍යාණි එක්වීමෙන් වලත චමුපති - අරෝෂ් අසංග හා පමෝද් පියුෂාන් පුතුන් ලැබුණි.



*කල්‍යාණියේ ඔබ නෑසු*
*කතාවක් කියන්නම්*
*ඇත්තයි එය මම දිවුරා කියන්නම්*

සිය ගීත අතරින් ප්‍රියතම ගීය ලෙස මිල්ටන් පෙරේරා විසින් හඳුන්වන ලද්දේ මෙම ගීතයයි. 'සල්ගස වට මල් වැල මෙන් ' ගීතයේද 'කල්‍යාණියේ සුපෙම් සුවද. . . ' යන යෙදුම ඇත. මිල්ටන් - කල්‍යාණි විවාහ මංගල අවස්ථාවේ එම උත්සවයේදීම 'කල්‍යාණියේ මංගලම් ' ගීය කරු අයියා (කරුණාරත්න අබේසේකර ශූරීන්) ලියා දී ඇති අතර එය එතැනදීම මිල්ටන් ගායනා කර ඇත.

'ඔරුවක පාවෙන රෑ ගඟ අඳුරේ ' ගීය ගයමින් 1969 දී ගී ලොවට ආ මිල්ටන් මල්ලවආරච්චි 'ඈත එපිට දුර ආකාසේ ' ගීය ගයා ඇත්තේ එවකට තම පෙම්වතිය (පසුව බිරිඳ) වූ ස්වර්ණමාලි පනංගල වෙනුවෙනි. කරු අයියා එහිදී 'ස්වර්ණ වර්ණ තරුවක් ' ලෙස ස්වර්ණමාලිව හඳුන්වයි.

*ඈත එපිට දුර ආකාසේ*
*වලාකුලුවලින් මිදී*
*බලා එබිලා ඇදී*
*ස්වර්ණ වර්ණ තරුවක් දිලිසේ*

වරක් යුරෝපා සංචාරයක යෙදුණු අපගේ දක්ෂ තරුණ වාදකයෙකු සීතල රටකදී හමු වූ 'මධු' නමැති යුවතියට පෑ එක්පාර්ශ්වික ආදරය ගැන ලියවුණ 'සීතල හිම රටේ ' ගීය මිල්ටන් ගායනා කළේ 'මධු' ගී එකතුවටයි.

*තනි වී සිටින්නයි මා*
*අදහස් කළේ*
*ඔබමයි සොයා ඇවිදින්*
*එය වෙනස් කළේ*



ක්ලැරන්ස් විජේවර්ධනයන් විසින් ලියා සංගීතවත් කරනු ලැබූ මේ ගීතය ක්ලැරන්ස්ගේ ආදර අත් දැකීමක් පාදක කරගෙන මිල්ටන් ගැයූ ජනප්‍රියම ගීතයකි. මෙහි අග හරියේ ඇති විසකටු - රුධිරය වැනි 'සැර වැඩි ' වදන් වෙනස් කරන්නැයි මිල්ටන් මෙය පටිගත කරනදා නුගේගොඩ 'ඔහී' ශබ්දාගාරයේදී ක්ලැරන්ස්ට කීවත් ක්ලැරන්ස්ගේ පිළිතුර මෙසේ විය.

***එක වචනයක්වත් වෙනස් කරන්නෙ නෑ, ගීත ඔහොමම කියපන්. සුපර් හිට් එකක් වෙනවා. . . .***

ක්ලැරන්ස්ගේ අනාවැකිය සියයට දහසකින් සැබෑ වූ අතර 'තනි වී සිටින්නයි' ගීතය අද පවා මිල්ටන්ගේ ගීත ලෝලීන් අතර අති ජනප්‍රිය ගීතයකි.

ආනන්ද පද්මසිරි